රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 04/2013

මගේ අංකය : EST/7/LEAVE/03/3186
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ - 07.

2013 පෙබරවාරි මස 14 දින.

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

<u>උපාධිධාරී අභ්‍යාසලාභීන් සඳහා නිවාඩු ලබා දීම.</u>

දත්ත හා තොරතුරු රැස්කිරීම, ප්‍රමුඛතා පදනමින් ව්‍යාපෘති හා වැඩසටහන් හඳුනා ගැනීම වැනි කාර්යයන් සඳහා 2011.12.14 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි බඳවාගත් උපාධිධාරී අභ්‍යාසලාභීන්ට පහත සඳහන් පරිදි නිවාඩු ලබාදීමට 2012.12.19 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

I. මාස නවයක (09) පුහුණු කාලයක් සපුරා ඇති උපාධිධාරී අභ්‍යාසලාභීන්ට මසකට අනියම් නිවාඩු දෙකක් (02) ලබාදීම.

II. මාස නවයක (09) පුහුණු කාලයක් සපුරා ඇති කාන්තා උපාධිධාරී අභ්‍යාසලාභීන්ට දින අසූ හතරක (84) සම්පූර්ණ වැටුප් සහිත ප්‍රසූත නිවාඩු ලබාදීම.

02. ඒ අනුව අවශ්‍ය කටයුතු කරන ලෙස හා ඔබ යටතේ ඇති සියළුම ආයතන ද දැනුවත් කරන ලෙස දන්වා සිටිමි.



පි. බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය